# ලංසු කැඳවීම
# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
# SLCORSnet දිවයින පුරා ස්ථාපනය කිරීම - 2025
# ලංසු අංකය - SD/IV/2025

01. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව අනුව SLCORSnet දිවයින පුරා ස්ථාපනය කිරීම සඳහා ලංසුකරුවන් වෙතින් මුද්‍රා සහිත ලංසු ඉදිරිපත් කිරීම සඳහා කරනු ලබන ආරාධනයයි.

02. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු කැඳවීමේ පටිපාටිය මත තනි අදියර ද්විත්ව කවර ලංසු කැඳවීමේ පටිපාටිය අනුව සිදු කෙරේ.

03. ඒ සඳහා උනන්දුවක් දක්වන ලංසු තබන්නන්, සර්වේයර් ජනරාල් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්) වෙතින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකි අතර පහත සඳහන් ලිපිනයේදී 2025.08.06 දින සිට 2025.08.25 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා වූ කාර්යාල වේලාවන් තුළ ලංසු කැඳවීමේ ලිපි ලේඛන පරීක්ෂා කළ හැකිය.

04. රුපියල් විසිපන්දහස (රු.25, 000.00) ක් වන නැවත නොගෙවන මුදලින් 2025.08.25 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කරනු ලබන ගෙවීම් මත කාර්යාල වේලාව තුළ ලංසු කැඳවීමේ සම්පූර්ණ ලේඛන කට්ටලයක්, පහත සඳහන් ලිපිනයට පැමිණ අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු තබන්නන්ට ලබා ගත හැකිය.

05. පූර්ව ලංසු රැස්වීම 2025.08.14 දින පෙ.ව. 9.30 ට සර්වේයර් ජනරාල් කාර්යාලයේදී පවත්වනු ලැබේ.

06. පිටපත් දෙකකින් සකස් කරන ලද ලංසු පත්‍ර ඇතුලත් කරන ලද කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි **'SLCORSnet දිවයින පුරා ස්ථාපනය කිරීම - 2025"** සඳහන් කර ලංසු අඩංගු මුද්‍රා තැබූ ලිපි කවර 2025.08.26 දින පෙ.ව.11.30 ට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2025.08.26 දින පෙ.ව.11.35 ට පහත සඳහන් ලිපිනයේදී ලංසු තබන්නන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ. සියලුම ලංසු, ලංසු සුරැකුම් ගාස්තු ගෙවන ලද රිසිට් පත්‍රයේ ඡායා පිටපතකින් සමන්විත විය යුතුය.

07. ලංසු සුරක්ෂණ වටිනාකම රුපියල් ලක්ෂ විස්සකි. (රු.මි.2 කි)

***ලිපිනය:*** ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්), සර්වේයර් ජනරාල් කාර්යාලය, නො: 150, කිරුළ පාර, කොළඹ 05. දුරකතන / ෆැක්ස් : 0112 -368106

සර්වේයර් ජනරාල්,
2025.08.04